# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.04 පැය 0530 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/13/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. වෙඩිතබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම - වැලිගම පොලිස් වසම**

2024.01.04 වන අද දින අළුයම් කාලයේ වැලිගම පොලිස් වසමේ කප්පරතොට වල්ලිවෙල මාර්ගයේ පා ගමන් ගමන් කරමින් සිටි පුද්ගලයින් පස් දෙනෙකුට යතුරු පැදි 03 කින් පැමිණි නාඳුනන පිරිසක් විසින් වෙඩි තබා පලාගොස් ඇති අතර වෙඩි වැදීමෙන් පුද්ගලයින් දෙදෙනෙකු තුවාල ලබා වලාන රොහලට ඇතුළත් කිරීමේදී එක් පුද්ගලයෙකු මියගොස් ඇති අතර අනෙක් පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා මාතර රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් සහ තුවාලකරු වයස අවුරුදු 29 ක් වන කප්පරතොට ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සෙසු පුද්ගලයින් තිදෙනා තුවාල ලබා නොමැති අතර වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැලිගම පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අවශ්‍ය කරනු ලබන සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2025.01.03 වන දින සවස් කාලයේ කාලයේදී වැලිකඩ පොලිස් වසමේ අපරාධ නිවාරණ රාජකාරි යෙදී සිටි බස්නාහිර පළාත දක්ෂණ අපරාධ කොට්ඨාසයේ නිලධාරින් කණ්ඩායමක් විසින් බණ්ඩාරනායකපුර ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 210 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිකඩ පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු සම්බන්ධව සිදුකළ වැඩිදුර විමර්ශනයේදී 2024.12.20 වන දින මිරිහාන පොලිස් ස්ථානය වෙත වාර්තා වී තිබූ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන රැහැන් කපා සොරකම් කිරීමේ අපරාධයට සම්බන්ධ සැකකරු බවට අනාවරණය වි ඇති අතර කපා සොරකම් කළ රැහැන් උණුකර ලබා ගන්නා ලද තඹ කම්බි කිලෝ 01 ක් ද සැකකරු භාරයේ තිබී සොයාගෙන ඇත. එමෙන්ම වැලිකඩ පොලිස් ස්ථානය මඟින් අළුත්කඩේ සහ මාලිගාකන්ද ගරු අධිකරණ දෙකෙහි පවත්වාගෙන යනු ලබන නඩු දෙකක් සඳහා සැකකරුට වරෙන්තු නිකුත් කර ඇති සැකකරුවෙකු බවට ද අනාවරණය වී ඇත.

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2025.01.03 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ වටරප්පල පාර ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට -කිරිබත්ගොඩ පොලිස් ස්ථානය.**

2025.01.03 වන දින උදෑසන කාලයේදී කිරිබත්ගොඩ පොලිස් වසමේ මිත්‍රානන්ද මාවතේ දී කිරිබත්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 550 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන මාදම්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2025.01.03 වන දින උදෑසන කාලයේදී තලංගම පොලිස් වසමේ 08 කණුව ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන තලාහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වෙරළබඩ පොලිස් ස්ථානය.**

2025.01.03 වන දින රාත්‍රී කාලයේදී වෙරළබඩ පොලිස් වසමේ රත්නම් පාර ප්‍රදේශයේදී වෙරළබඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වෙරළබඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2025.01.03 වන දින උදෑසන කාලයේදී ගම්පහ පොලිස් වසමේ උඩුගම්පල ප්‍රදේශයේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන උඩුගම්පල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඉංගිරිය පොලිස් ස්ථානය.

2025.01.03 වන දින සවස් කාලයේ ඉංගිරිය පොලිස් වසමේ ධීරානන්ද මාවතේදී ඉංගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබා සිටි** සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 78 ක් වන පෝරුවදණ්ඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2025.01.03 වන දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව සහ මාදංගහවත්ත ප්‍රදේශවලදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක් සහ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 450 ක් සන්තකයේ තබා සිටි** සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36 හා 41 වයස්වල පසු වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොල්පිතිගම පොලිස් ස්ථානය.

2025.01.03 වන දින දහවල් කාලයේ පොල්පිතිගම පොලිස් වසමේ වදුරැස්ස ප්‍රදේශයේදී පොල්පිතිගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 78 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන වදුරැස්ස, මාළිගිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.

2025.01.03 වන දින දහවල් කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ මුල්ලේගම ප්‍රදේශයේදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 52.5 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කෝකිලායි පොලිස් ස්ථානය.

2025.01.03 වන දින උදෑසන කාලයේ කෝකිලායි පොලිස් වසමේ කෝකිලායි නැගෙනහිර ප්‍රදේශයේදී කෝකිලායි පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කෝකිලායි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කෝකිලායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නොච්චියාගම පොලිස් ස්ථානය.

2025.01.03 වන දින දහවල් කාලයේ නොච්චියාගම පොලිස් වසමේ මහළිදවැව ප්‍රදේශයේදී නොච්චියාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන ඇලයාපත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. මාරක රිය අනතුරක් - ආණමඩුව පොලිස් වසම.

2025.01.03 වන දින දහවල් කාලයේ ආණමඩුව පොලිස් වසමේ කටුගස්තොට පුත්තලම මාර්ගයේ තෝනිගල ප්‍රදේශයේදී ආණමඩුව දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරළීගොස් මාර්ගයේ මැදට වැටී පැදිකරු එම දිශාවටම ගමන් කළ ලොරි රථයකට යටවීමෙන් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ආණමඩුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ මහකුඹුක්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ආණමඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**